**මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------------**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 මැයි 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**---------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පරිත්‍යාග කරන ලද යන්ත්‍ර හා උපකරණ 90 ක වටිනාකම වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) පරිත්‍යාග කරන ලද වර්ග 13 කට අයත් ගෘහ භාණ්ඩ හා උපකරණ 84 ක වටිනාකම අවුරුදු 05 කට වඩා වැඩි කාලයක සිට ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට පරිත්‍යාග කරන ලද වාහන 28 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි. කෙසේ වුවද, හිමිකාරීත්වය පිළිබඳ විස්තර, නඩත්තු සහ අලුත්වැඩියා විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී නිමකළ යුතුව තිබූ රු.6,983,138 ක් වන ප්‍රාග්ධන වැඩ 11 ක් නිමකර නොතිබූ අතර ණයහිමි ගිණුමේ ප්‍රතිපාදන සලසා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වැඩිපුර දක්වා තිබුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.10,541,558 ක් වූ වර්ග 10කට අදාල හිඟහිටි ආදායම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සාප්පු වෙළඳ සංකීර්ණයෙන් අයවිය යුතු මුළු කුලී මුදල රු.1,756,549 ක් වූ අතර රු.1,676,549 ක මුදලක් පමණක් අයකර ගෙන තිබුණි. එමෙන්ම රු.80,000 ක මුදලක්ද, අයකර ගෙන නොතිබුණි.

(ඇ) සාප්පු වෙළඳ සංකීර්ණයෙන් අයවිය යුතු බදුකුලී එකතුව රු.172,084 ක් වන අතර එය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, වසර 03 කට වැඩි කාලයක් හිඟ වශයෙන් පැවතීමට ඉඩකඩ සළසා තිබුණි.

(ඈ) වසර 05 සිට 08 ක කාල පරාසයකට අදාලව විශ්‍රාම ගිය, මියගිය සහ ස්ථාන මාරුවීම් ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.1,148,646 ක් වන අතර එම ණය අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (I) පරිච්ඡේදය 111 රීති 33 | සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු සඳහා සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (II) පරිච්ඡේදය 111 රීති 59 හා 60 | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාර බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ආ) විගණන සහ කළමනාකරණ චක්‍රලේඛ 2009 ජුනි 09 දිනැති හා අංක DMA/2009(1) දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ රැස්වීම් 04 ක් පවත්වා තිබිය යුතු බව සඳහන් වී තිබුණද, එවැනි රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශක අත්පොත
වගන්තිය 5.4.12

එකතුකළ අගය මත බදු (VAT) සභාව විසින් ගෙවීම් කිරීමෙන් පසු එහි විස්තර එළඹෙන මාසයේ 15 වන දිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ද එහි පිටපතක් විගණකාධිපතිවරයාට ද යවා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
-----------------------------------------------
මු.රෙ. 571

(i) එකතුව රු.1,236,545 ක් වූ රඳවා ගත් මුදල් තැන්පතු 12 ක් තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබූ අතර මාස 14 සිට මාස 36 ක පරාසයක් තුල ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) එකතුව රු.383,137 ක් වූ ටෙන්ඩර් තැන්පතු 05 ක මුදල් තැන්පතු ගිණුමේ පසුගිය මාස 12 සිට මාස 19 ක කාලයක් නිසි ක්‍රියාමාර්ග නොගෙන රඳවා ගෙන තිබුණි.

(iii) එකතුව රු.762,539 ක් වූ විවිධ තැන්පතු 07 ක වටිනාකම තැන්පත් ගිණුම් මාස 02 සිට මාස 27 ක කාලයක් නිසි ක්‍රියාමාර්ග නොගෙන රඳවා ගෙන තිබුණි.

(iv) එකතුව රු.42,800 ක් වූ කුලී තැන්පතු 12 ක වටිනාකම තැන්පතු ගිණුමේ මාස 12 සිට 24 ක් කාලපරාසයක ක්‍රියාමාර්ගයක් නොගෙන රඳවා තිබුණි.

**2. මූල්‍ය විශ්ලේෂණය**
**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
**------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.29,151,362 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.26,614,087 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,537,275 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ පුනරාවර්තන ප්‍රදානවල වැඩිවීම සහ පුනරාවර්තන ආදායම වැඩිවීම වේ.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පෙර වර්ෂයේ ශුද්ධ අතිරික්තය වූ රු.24,734 ක මුදල සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.165,140 ක ශුද්ධ අතිරික්තයක් වූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.140,406 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.3 මූල්‍ය සමාලෝචනය

### 2.3.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පෙර වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.79,273,926 ක මුදල සමඟ සැසඳීමේදී සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.99,132,459 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.19,858,533 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.4 ආදායම් පරිපාලනය

**විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු**

සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 11 ක් සම්බන්ධයෙන් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමනයන් ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, මූලික සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතිය ලබාදීම යන හතර (04) ආකාරයේ ගාස්තු තක්සේරු කළයුතු අතර ඒවා අයකරගෙන ගිණුම්වලට ගතයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 24 ක් පිරවීමට කටයුතු කර නොතිබූ හෙයින් ආදායම් පරීක්ෂකවරුන්ගේ සහ වෙළඳසැල් අධීක්ෂකවරුන්ගේ කාර්යභාරයන් ඉටුකිරීම් සඳහා කාර්යාල කාර්ය සහායකයන්ට ඉඩ දී තිබුණි.

### 3.2 අත්හැර දමන ලද ව්‍යාපෘති

රු.47,000,000 ක පිරිවැයකට ඇස්තමේන්තුකරන ලද ප්‍රාග්ධන වැඩ 11 ක් සමාලෝචිත වර්ෂයේදී අත්හැර දමා තිබුණි. මෙම ප්‍රාග්ධන වැඩ අත්හැර දැමීමට අදාළ හේතූන් විගණනයට සපයා නොතිබුණි.

### 3.3. ව්‍යාපෘති ප්‍රමාද වීම

සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.3,938,555 ක ව්‍යාපෘති 07 ක් ප්‍රදානය කර තිබූ අතර වැඩ ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම වැඩ නිමකර නොතිබුණි.

### 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැලි කසළ පිළිස්සීම සහ පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණු අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

## 4.1 අයවැය පාලනය

-----------------

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් රු.70,170 ක සිට 5,229,225 ක පරාසයක විචලනය වී තිබූ අතර අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු.100,000 සිට රු.3,646,227 ක පරාසයකට විචලනය වී තිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීම

(ii) ආදායම් රැස්කිරීම

(iii) ස්ථාවර වත්කම්

(iv) ගිණුම්කරණය

(v) සේවක සංඛ්‍යාව

(vi) පරිත්‍යාග

(vii) විවිධ තැන්පත්

(viii) අයවැය පාලනය

(ix) ගබඩා පාලනය

(x) ප්‍රසම්පාදන ක්‍රියාවලිය